මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019-05-23

පැමිණිලිකරු : නීතිඥ මධුර චින්තක ගමගේ මහතා,
නො. 49/3 බී, එඬේරමුල්ල,
අම්බලන්ගොඩ.

වගඋත්තරකරුවන් :

1. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2. ප්‍ර.පො.ප.මන්දනායක මහතා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ගිරිඋල්ල.

3. පො.ප ප්‍රසන්න මයා,
ස්ථානාධිපති (අපරාධ අංශය),
පොලිස් ස්ථානය,
හික්කඩුව.

වර්ථමාන සේවා ස්ථානය - පොලිස් ස්ථානය, කරන්දෙනිය

පැමිණිලි අංකය : **HRC/1317/15/I - iii**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, නීතිඥයෙකු වන තමා 2015.04.08 වන දින ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : **3587** දරණ නඩුවේ අවශ්‍ය සැකකරුවන් බවට බී වාර්තාවේ නම් කර තිබූ සැකකරුවන් දෙදෙනෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් ශාලාව තුළ අසුන් ගන්වා සිටි බවත්, එහිදී මහේස්ත්‍රාත්තුමාගේ කෙටි විවේකය සඳහා අධිකරණ කටයුතු අඩාල කළ බවත්, එහිදී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115 වගන්තිය ප්‍රකාරව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 / 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

අධිකරණයට සහය දීමක් වශයෙන් පොලිසියට එනෙක් අත්අඩංගුවට ගැනීමට නොහැකිව සිටින සැකකරුවන් දෙදෙනෙකු අධිකරණයට භාර කිරීමට සූදානම්ව සිටියදී එවකට හික්කඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති මහතාද, එවකට හික්කඩුව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති සහ සිවිල් ඇඳුමින් සැරසුනු විශාල පොලිස් නිලධාරීන් පිරිසක් විසින් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ ශාලාව තුළට පැමිණ අදාළ සැකකරුවන් පොලිස් නිලධාරීන් විසින් බලහත්කාරයෙන් අධිකරණ ශාලාවෙන් පිටතට ඇදගෙන ගිය බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකාර නීතිඥ මහතා ද පොලිස් නිලධාරීන්ගේ ග්‍රහණයට ලක්වූ බවත්, ඔහුවද අධිකරණ ශාලාවෙන් එපිටට ඇදගෙන ගිය බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තමා කිසිදු වරදක් නොකර තිබියදී පොලිසිය විසින් කිසිදු චෝදනාවක් පැහැදිලි කිරීමකින් තොරව නිර්දෝෂී පුද්ගලයෙකු වූ ඔහුව අධිකරණ ශාලාවෙන් පිටතට රැගෙන යාමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවත්, ලංකාවේ ඕනෑම තැනක යාම් ඊමේ නිදහස වගඋත්තරකරුවන් විසින් අහිමි කර ඇති බවත්, ප්‍රායෝගිකව අධිකරණයට නීතිඥ මහතෙකුට පිළිගත් නීතියට අනුව පොලිසියට අත්අඩංගුවට ගැනීමට නොහැකි සැකකරුවන් අධිකරණයට භාර කළ හැකි බවත්ය. ඒ මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිය පසිඳලීමේදී නීතිය සර්ව සාධාරණ විය යුත්තේය යන්න සහ පුරවැසියෙකු කවර හේතුවක් මතවත් වෙනස්කමකට භාජනය නොවිය යුත්තේය යන්නද උල්ලංඝනය වී ඇති බවට දක්වා ඇත. පැමිණිලිකරු නීතිඥවරයෙක් වන අතර, පෙර කී ආකාරයට වෙනත් නීතිඥ මහතුන් මෙන් සැකකරුවන් අධිකරණයට භාරකිරීමට යාමේදී පොලිසිය විසින් එම අයව අධිකරණ ශාලාවේ දී අත්අඩංගුවට ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් බවත්, පැමිණිලිකරු මෙම සිද්ධිය සම්බන්ධයෙන් **2015.04.08** වන දින නඩු අංක : **35387** දරණ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේ දී මහේස්ත්‍රාත්වරයාට දැනුම්දුන් බවත් සඳහන් කර ඇති අතර එම නඩුවේ කාර්ය සටහන් වල සහතික පිටපත් ද පැමිණිල්ලට යා කර ඇත.

**පැමිණිල්ල ඉදිරිපත් කරන සාක්ෂි :-**

සිද්ධිය ඇසින් දුටු සාක්ෂි වශයෙන් නීතිඥ දොඩම්ගොඩ මහතා සහ නීතිඥ රජින්ද්‍ර යන අය විසින් දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇත.

<u>නීතිඥ මද්දුම දොඩම්ගොඩගේ සමීර ප්‍රසාද් දොඩම්ගොඩ මහතාගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු-</u>

තමා **2015.04.08** වන දින නීතිඥ පී.ඩී.මදුර චින්තක මහතා සමග ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක **35387** දරණ නඩුව සඳහා අවශ්‍යයැයි නඩු වාර්තාවේ සඳහන් කර තිබූ

සැකකරුවන් දෙදෙනෙකුව ඔවුන්ගේ උපදෙස් මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව ගරු අධිකරණයට භාරදීම සඳහා ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයට ගිය බවත්, එම සැකකරුවන් දෙදෙනා වන තුන්නැහිහන්දි ඉමේෂ් ප්‍රියංකර සහ මෙරිඤ්ඤ ශ්‍රීමාල් තුෂාර යන අයවළුන්ට තමා සහ නීතිඥ මධුර චින්තක මහතා විසින් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ ශාලාවේ අසුන් ගැනීමට උපදෙස් දුන් බවත්, එම උපදෙස් අනුව ඔවුන් දෙදෙනා අධිකරණ ශාලාවේ අසුන් ගත් අතර අධිකරණයේ නඩු ඇසීම ආරම්භ වී නඩත්තු නඩු කැඳවීමෙන් පසුව අධිකරණ කටයුතු මදක් අඩාල කර විනිසුරුතුමා අසුනින් බැස යනවාත් සමග ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් ශාලාව තුළට කඩා වැදුනු හික්කඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. මන්දනායක මහතා සහ නිල ඇඳුමින් සහ සිවිල් ඇඳුමින් සැරසුනු විශාල පොලිස් නිලධාරින් පිරිසක් විසින් ඔවුන් විසින් අධිකරණයට භාරදීමට ගෙන ආ සේවාදායකයින් දෙදෙනා ඇදගෙන යාමට උත්සහ කරන ලද බවට සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් ශාලාව තුළ නීතිඥ මහත්ම මහත්මීන් විශාල සංඛ්‍යාවක් සිටි අතර, බන්ධනාගාර නිලධාරින්, අධිකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්, නඩු කටයුතු සඳහා පැමිණි සාමාන්‍ය ජනතාව විශාල පිරිසක් සිද්ධිය ඇසින් දුටු බවටද සඳහන් කර ඇත. මේ අවස්ථාවේදී පොලිස් නිලධාරින්ගේ මෙම ක්‍රියාවට තමා ඇතුළු නීතිඥවරුන් බලවත් ලෙස විරෝධය ප්‍රකාශ කළ අතර, ඒ බව නොසලකා පොලිස් නිලධාරින් තමාවද පසෙකට ඇද දමා සැකකරුවන් අධිකරණ ශාලාවේ බන්ධනාගාර දොරටුවෙන් එළියට ඇදගෙන යන ලද බව සඳහන් කරඇත. එම අවස්ථාවේදී නීතිඥ මධුර චින්තක මහතාද පොලිස් නිලධාරින්ගේ ග්‍රහණයට හසුව අධිකරණ ශාලාවේ සිට එළියට ඇදගෙන යනු තමා සියැසින් දුටු බවද සඳහන් කර ඇත. මෙම සිද්ධිය පිළිබඳව මධුර චින්තක මහතා විසින් 35387 දරණ නඩුව විවෘත අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී ඒ බව වාර්තා කළ අතර, තමා මෙම සිද්ධිය වූ ස්ථානයේ මුල සිට රැඳී සිටි බවත්, එය සියැසින් දුටු බවත් සහතික කර ඇත.

<u>නීතිඥ චන්ද්‍රනාත් රජින්ද්‍ර නාරංගොඩ මහතාගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු :-</u>

තමා 2015.04.08 වන දින ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : 54862, 29973, 35829 සහ 23247 දරණ නඩු වලට විවෘත අධිකරණයේ පෙනීසිටි නීතිඥවරයා බවත්, එදින අධිකරණයේ නඩු කැඳවීමෙන් පසුව අධිකරණයේ කටයුතු මදකට අඩාල කර විනිසුරුතුමා අසුනින් බැස යනවාත් සමග ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් ශාලාව තුළට කඩා වැදුනු හික්කඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. මන්දනායක ඇතුළු නිල ඇඳුමින් සහ සිවිල් ඇඳුමින් සැරසුනු විශාල පොලිස් නිලධාරින් පිරිසක් විසින් අධිකරණයට භාරකිරීමට ගෙන ආ සැකකරුවන් දෙදෙනා විවෘත අධිකරණ ශාලාව තුළදී ඇදගෙන යාමට උත්සහ කරන ලද බවත් සඳහන් කර ඇත. සැකකරුවන් දෙදෙනා අධිකරණයට භාරදීමට නීතිඥ මහතුන් දෙදෙනකු පැමිණ සිටි අතර, පසුව දැනගත් පරිදි ඔවුන් දෙදෙනා නීතිඥ මධුර චින්තක ගමගේ සහ නීතිඥ

සමීර දොඩම්ගොඩ යන මහතුන් බවත්, පොලිස් නිලධාරින්ගේ මෙම ක්‍රියාකලාපයට සෙසු නීතිඥවරුන්ද විරෝධතාවය ප්‍රකාශ කළ අතර, ඒ බව නොසලකා පොලිස් නිලධාරින් සැකකරුවන් දෙදෙනා අධිකරණ ශාලාවෙන් බලහත්කාරයෙන් බන්ධනාගාර දොරටුවෙන් එළියට ඇදගෙන ගිය බවත් දක්වා ඇත. මෙම සැකකරුවන් දෙදෙනා අධිකරණයට බාරදීමට පැමිණි නීතිඥ මහතුන් දෙදෙනාගෙන් එක් නීතිඥ මහතෙකු පොලිස් නිලධාරින්ගේ ග්‍රහණයට අසුවී අධිකරණ ශාලාවේ සිට එළියට ඇදගෙන යනු තමා දුටු බවද ඉන්පසුව නීතිඥ මධුර මහතා විසින් **35387** දරණ නඩුව විවෘත අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී සිද්ධිය වාර්තා ගත කළ අතර, එම සිද්ධිය වූ ස්ථානයේ මුල සිටම රැඳී සිටි බවත්, සියල්ල සියැසින් දුටු බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ මහේස්ත්‍රාත් කේසර චිත්‍රරංජන් අනුරාධ සමරදිවාකර මැතිතුමා ඉදිරිපිට **2015.04.08** වන දින නඩු අංක : **35387** දරණ නඩුවේ දී නීතිඥ මධුර ගමගේ මහතා විවෘත අධිකරණයේ පෙනීසිටිමින් මෙම සිදුවීම සම්බන්ධයෙන් කරුණු දක්වා ඇති බව නිරික්ෂණය වී ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකරුවන් පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, කොමිෂන් සභාවේ **2016.06.02** වන දින පැවති පරීක්ෂණයේදී පළවන වගඋත්තරකාර ප්‍ර.පො.ප. හිටපු ස්ථානාධිපති, මන්දනායක මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිල්ලට අදාලව ප්‍රදේශයේ සිදුවූ මිනීමැරුමක් සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණයක් සිදුකල බවත්, සැකකරුවන් ගාල්ල අධිකරණයට භාරවීමට සූදානම් බවට ලැබුනු තොරතුරක් මත අධිකරණ භූමියෙන් පිටත ස්ථාන ගතවී සිටින විට කළු පාට කාර් රථයකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු ඉදිරියට පැමිණි අතර, ඒ අවස්ථාවේදී පො.කො.**39185** අජිත් යන අය විසින් සංඥාවක් කළ අතර, මෙම අය අදාළ සැකකරුවන් බවට හැඟී ගිය බැවින් එම අවස්ථාවේදී සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගත් බවයි.

කොමිෂන් සභාව වගඋත්තරකරුගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කර ඇත්තේ, නීතිඥ මහතා භාරයේ සිටියදී අදාළ සැකකරුවන් අත්අඩංගුවට නොගත් බවත්, මෙම කාර් රථයේ පැමිණිලිකාර නීතිඥ මහතා සිටි බවට අනාවරණය වූ බවත්, මෙම පැමිණිලිකාර නීතිඥ මහතා සැකකරුවන් සමග අධිකරණයට පැමිණෙන බවට පෙර දැන සිටි බවත්, පැමිණිලිකරු ඔහු ප්‍රකාශ කරන ආකාරයට ඇදගෙන නොගිය බවත්, අමානුෂික සහ කෲර ලෙස සැලකීමකට ලක් කිරීමක් නොකළ බවත්, මන්ද, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී නීතිඥ මහතුන් දෙදෙනා එම ස්ථානයේ නොසිටි බවත්ය.  මෙම සැකකරුවන් මෙසේ අත්අඩංගුවට ගනු ලැබුවේ

මිනීමැරුම සඳහා යොදාගත් අවිය මොවුන් භාරයේ තිබූ බවට තොරතුරු ලැබී තිබූ බැවින් අදාළ පරීක්ෂණ නිසි පරිදි සිදුකර ගැනීමට අවශ්‍ය නිසා බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකාර නීතිඥ මහතා විසින් අදාළ සැකකරුවන් අධිකරණයට භාරකිරීමට සූදානම්ව සිටියදී ඔවුන් භාරයේ සිටි සැකකරුවන් වගඋත්තරකරු විසින් අත්අඩංගුවට ගෙන ඇති බවට ඉදිරිපත්ව ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ. මේ බව නීතිඥ සමීර ප්‍රසාද් දොඩම්ගොඩ යන අය සහ නීතිඥ චන්ද්‍රනාත් රජින්ද්‍ර නාරංගොඩ යන අය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ අනුව ද, ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : 35387 නඩුවේ 2015.04.08 වන දින සටහන් වල පැමිණිලිකාර නීතිඥ මහතුන් භාරයේ සිටි මෙම සැකකරුවන් වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගත් බවට සටහන් වීම තුලින්ද තවදුරටත් තහවුරු වේ.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාර නීතිඥ පී. මධුර චින්තක මහතාව පොලිස් නිලධාරින්ගේ ග්‍රහණයට ගෙන අධිකරණ ශාලාවේ සිට එළියට ඇදගෙන ගිය බව ඉදිරිපත් වී ඇති දිවුරුම් ප්‍රකාශ දෙකෙන් සහ නඩු වාර්තා සටහනින් තහවුරු වන බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

1979 අංක 15 දරණ හා 1979 අංක 36 සිට 2013 අංක 02 දරණ සංශෝධිත සහිත අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115 වන වගන්තියෙහි 3 වන උප වගන්තිය යටතේ දණ්ඩ නීති සංග්‍රහයේ 114, 191 වන හා 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදුකර ඇති බවට හෝ සිදුකිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදුකර ඇතැයි සැකකරනු ලබන බවට හෝ සිදුකිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි සැකකරනු ලබන බවට වූ චෝදනාවට ප්‍රතිඵලයක් වශයෙන් (අ) තමා විසින්ම අධිකරණයට භාර වූ හෝ (ආ) සිර භාරයට ගන්නා ලද යම් තැනැත්තෙක් මහේස්ත්‍රාත්වරයෙකු විසින් ඇප පිට හෝ අන්‍යාකාරයකින් හෝ මුදා හැරිය නොලැබිය යුතුය.

මෙම වගන්තියේ තමා විසින්ම අධිකරණයට භාරවූ හෝ යන ප්‍රතිපාදනය මත නීතිඥවරයෙකුට ඉහත සඳහන් කර ඇති වැරදි සම්බන්ධයෙන් චෝදනා ලබන සැකකරුවෙකුව භාර කිරීමේ නීතිමය ප්‍රතිපාදන ඇත.

මෙම නීති ප්‍රතිපාදන යටතේ අධිකරණයට භාර කිරීමට නීතිඥවරයෙකු භාරයේ සිටින සැකකරුවෙකු අධිකරණ භූමිය තුළ අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම අදාළ

සැකකරුවන් හා පැමිණිලිකාර නීතිඥවරයා සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති අතර. විවෘත අධිකරණ භූමියක් තුළ පැමිණිලිකාර නීතිඥ මහතාව පොලිස් ග්‍රහණයට ගෙන ඇදගෙන යාම තුළ ඔහුව කෲර හා අමානුෂික සැලකිල්ලකට භාජනය වී ඇති බවද නිරීක්ෂණය වේ. එමගින් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති 11 ව්‍යවස්ථාව පැමිණිලිකාර නීතිඥ මහතා සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2019.06.21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/